www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාන්ඩුව පාසල් සිසුන් ඝාතනය යුක්ති සහගත කරයි

## Sri Lankan government justifies the massacre of school students

**විලානි පීරිස් විසිනි**
**2006 අගෝස්තු 17**

සඳුදා මුලතිව් දිස්ත්‍රික්කයේ දී ගුවන් හමුදාව සිදු කල ප්‍රහාරයකින් පාසල් ළමුන් ගනනාවක් දරුනු ලෙස ඝාතනයට ලක් වීම පිලිබඳව වර්ධනය වන සාක්ෂ්‍ය කන්දරාවට ශ්‍රී ලංකාන්ඩුව ප්‍රතිචාර දැක්වූයේ වඩ වඩාත් මුසාවාද ගෙතීමෙනි. එමගින් තව තවත් යුද අපරාධ සිදු කිරීම යුක්ති සහගත කිරීමකිනි.

සඳුදා හිමිදිරියේ යුද ගුවන් යානා කලින් ළමා නිවාසයක්ව පැවැති එම ස්ථානය මත එල්ල කල දැවැන්ත බෝම්බ ප්‍රහාරයෙන් අනතුරුව දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊය) නිවේදනය කලේ ප්‍රහාරයෙන් සිසුන් 61 දෙනෙකු ඝාතනයට ලක් වූ බවත් 129 දෙනෙකු තුවාල ලද බවත් ය. ඝාතනය වූ පිරිස අතර ප්‍රධාන වශයෙන් සිටියේ ගැහැනු ළමුන් බව ද සඳහන් විය. ප්‍රථමාධාර පිලිබඳ පාඨමාලාවකට සහභාගි වීම සඳහා අවට පාසල්වලින් පැමිනි ළමයින් පිරිස රාත්‍රි කාලයේ එල්ටීටීඊ පාලන ප්‍රදේශය තුල වූ වල්ලිපුනම්හි ගොඩනැගිලි කීපයක නිදා සිටියහ.

ගුවන් හමුදාව එල්ටීටීඊ පුහුනු කඳවුරකට බෝම්බ හෙලා එල්ටීටීඊ සටන්කරුවන් ඝාතනය කර ඇතැයි ප්‍රකාශ කරමින් මිලිටරිය සැනෙකින් මෙම ප්‍රකාශ ප්‍රතික්ෂේප කලේ ය. කෙසේ වුව ද එදා ම ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ (එස්එල්එම්එම්) ප්‍රධානියා වන උල්ෆ් හෙන්රික්සන් පැවසුවේ තම කන්ඩායම ප්‍රදේශයේ සංචාරය කර තිබෙන බවත් මිය ගොස් ඇත්තේ නව යොවුන් වියේ පසු වන පාසල් සිසුන් බවත් ය. ඔවුන් කිසිදු මිලිටරි ස්ථාපිතයක් හෝ ආයුධ නොදුටු බව හේ කියා සිටියේ ය.

ඒ ආසන්නයේ පිහිටි එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (යුනිසෙෆ්) කාර්යාලයක කාර්ය මන්ඩලයේ නිලධාරීහු තත්ත්වය තක්සේරු කිරීමට හා ඉන්ධන, වෛද්‍ය සැපයුම් හා උපදේශනය සැපයීම සඳහා බෝම්බ හෙලූ ස්ථානය වෙත ඉක්මනින් ගමන් කලහ. අඟහරුවාදා නිකුත් කල ප්‍රකාශයක දී යුනිසෙෆ් සංවිධානය කියා සිටියේ, යොවුන් වියේ ගැහැනු ළමුන් 40 දෙනෙකු ඝාතනයට ලක් වී ඇති බව හා 100 දෙනෙකු තුවාල ලබා ඇති බව සහ සමහරුන්ගේ තත්ත්වය බරපතල බව ය. යුනිසෙෆ් නියෝජිත ජොආනා වැන් ගර්පන් මාධ්‍යවලට මෙසේ පැවසී යː "ඔවුන් එල්ටීටීඊ සටන්කරුවන් යැයි කීමට මේ මොහොතේ අප සතුව කිසි ම සාක්ෂ්‍යයක් නැහැ."

වැඩෙන කෝපය මැඩලීමේ අපහසුතාවයෙන් යුතුව ආන්ඩුවේ ආරක්ෂක කටයුතු පිලිබඳ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල අඟහරුවාදා කොලඹ දී ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වී ය. ප්‍රහාරයට ගොදුරු වූවන් කෙරෙහි හෝ ඔවුන්ගේ දෙමාපියන් කෙරෙහි හෝ අංශුමාත්‍ර වූ හෝ සානුකම්පික බවක් පල නො කරමින් ආන්ඩුවේ අමාත්‍යවරයෙකු ද වන රඹුක්වැල්ල යලි යලිත් කියා සිටියේ එම ස්ථානය එල්ටීටීඊ පුහුනු කඳවුරක් ලෙස යොදා ගත්තක් බව යි. එමෙන් ම, පසු ගිය සති අන්තය පුරා මුහමලේ දී ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට එල්ල කල ප්‍රහාරයට එහි වූ පහසුකම් යටතේ පුහුනුව ලත් ළමුන් සම්බන්ධ වී ඇති බව යි.

රඹුක්වැල්ල වත් මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් අතුල ජයවර්ධන වත් තම කියා පෑම් සනාථ කිරීමට අංශුමාත්‍ර වූ හෝ සාක්ෂ්‍යයක් ඉදිරිපත් කලේ නැත. බෝම්බ හෙලීමට පෙර හා පසුව ගුවනේ සිට එම ස්ථානය හසු කර ගත් ඡායාරූප සාකච්ඡාවට එක් වූ මාධ්‍යවේදීන්ට පෙන්වන ලදි. ජපානයේ ක්යෝඩෝ වෙබ් අඩවිය මෙසේ අදහස් දැක්වී යː "... ප්‍රහාරයෙන් පසුව ගන්නා ලද ඡායාරූපවලින් කවුරුන් දැයි වෙන් කොට හඳුනා ගත නොහැකි පුද්ගලයන් එහිමෙහි දුවනු පෙනුනි. ආන්ඩුවේ ප්‍රකාශකයා ඔවුන් එල්ටීටීඊ සටන්කරුවන් යැයි විස්තර කලේ ය."

"ප්‍රහාරයට ලක් වූ කඳවුර පිහිටා තිබුනේ වෙඩි පුහුනුබිමකින් සමන්විත කැලෑ ප්‍රදේශයක ය," යි බ්‍රිගේඩියර් ජයවර්ධන මාධ්‍යවලට කී ය. මිලිටරිය විසින් වසර ගනනක් තිස්සේ ප්‍රදේශය නිරීක්ෂනය කොට තිබූ අතර, ප්‍රහාර එල්ල කලේ ඔත්තුකරුවන්ගෙන් ලද තොරතුරුද ඇතුලුව සති ගනනාවක් තිස්සේ තොරතුරු රැස් කර ගැනීමෙන් හා ඉලක්කය සවිස්තරාත්මකව පරීක්ෂා කිරීමෙන් පසුව යැයි ඔහු පැවසී ය. හේ සටන් විරාම නිරීක්ෂන කමිටුවේ හා යුනිසෙෆ් සංවිධානයේ

නියෝජිතයන් සැපයූ සාක්ෂ්‍ය පිලිබඳව වත් තොරතුරු එතරම් ම නිවැරදි වූයේ නම් මිලිටරිය හිතාමතා පාසල් සිසුන් ඝාතනය කලේ ඇයි දැයි පැහැදිලි කිරීමට වත් කරදර වූයේ නැත.

එමෙන් ම, ආරක්ෂක තොරතුරුවල නිරවද්‍ය භාවය පෙන්නුම් කිරීමට ඉක්මන් වූ අවස්ථාවේ බ්‍රිගේඩියර්වරයා අතින් සිදු වූ ප්‍රමාද දෝෂයකින් තහවුරු වූයේ මිලිටරිය වඩා දිගු කාලයක් තිස්සේ නො වේ නම් සති ගනනක් තිස්සේ එල්ටීටීඊයට එරෙහි ප්‍රහාරය සැලසුම් කරමින් සිටි බව යි. එනම්, "පුහුනු කඳවුර" ආසන්නයේ කොතැනක හෝ සිදු වූ බව කියන සටනකට බොහෝ කලකට ඉහත දී එය සැලසුම් කරන ලද බව යි. මුල පටන් ම ආන්ඩුව කියා සිටියේ එල්ටීටීඊයට එරෙහිව ජූලි 26 දා දියත්කල ප්‍රහාරය වනාහි මාවිල්ආරු සොරොව්ව විවෘත කොට ගොවීන්ට ජලය සැපයීම සඳහා සිදු කල "සීමිත, මානුෂීය" මෙහෙයුමක් බව යි. එහෙත් යථාර්ථයේ දී, වල්ලිපුනම් ළමා නිවාසය ද ඇතුලු අනෙකුත් එල්ටීටීඊ ඉලක්කයන්ට පහර දීමේ වඩා පුලුල් යුද්ධයක් සඳහා වූ සැලසුම් ඒ වන විටත් මිලිටරිය සතුව තිබින.

වඩාත් ම ඇඟ කිලිපොලා යන අදහස් පල වූයේ ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සම්බන්ධයෙන් එල්ටීටීඊයට එරෙහිව ආක්‍රෝෂ පරිභව බිනූ ඇමතිවරයාගෙනි. " වරක් ආයුධ පුහුනුව ලද පසු ඔවුන් සාමාන්‍ය ළමුන් ලෙස සැලකිය නොහැකි ය," යි රඹුක්වැල්ල ප්‍රකාශ කලේ ය. "තුවක්කුවක් අතැතිව ළමයෙකු සෙබලෙකුට වෙඩි තැබීමට ආවොත් ඔවුන් ඔහේ නිකම් හිට ගෙන ඉඳලා ඔහු බදා වැලඳ ගනීවි ය කියා බලාපොරොත්තු වෙන්න බැහැ. මේ වගේ වෙලාවක අපට ඔවුන්ගේ වයස ගැන බලන්න බැහැ, ඒ වෙනුවට ඔවුන් කරන්න යන්නේ කුමක් දැයි විමසා බැලිය යුතු යි."

පැහැදිලිව කියන්නේ නම්, සඳුදා අමු අමුවේ මරා දැමුනු එක ද ගැහැනු දරුවෙකු හෝ ශ්‍රී ලංකා හමුදා බෙලුනට ප්‍රහාර එල්ල කරමින් සිටියා නො වේ. ඔවුන් මිලිටරි පුහුනුවකට යොමු කර තිබුනු බවට කිසිදු සාක්ෂ්‍යයක් ද නැත. මුලුමනින් ම නිරාවරනය කල හොත් රඹුක්වැල්ලගේ තර්කය දිග හැරෙන්නේ මෙපරිද්දෙනි: එල්ටීටීඊය ළමා සොල්දාදුවන් පුහුනු කරයි. වල්ලිපුනම් ළමා නිවාසයේ ළමෝ සිටියහ. එම නිසා එය නීත්‍යානුකූල ඉලක්කයක් විය. වෙනත් වචනවලින් කියන්නේ නම්, සමස්ත ජනගහනය ම - ළමුන් මෙන් ම මිනිසුන් සහ ගැහැනුන් ද - සතුරන් සේ සැලකෙයි.

දකුනු ලෙබනනයෙහි තමන් කල යුද අපරාධ යුක්ති සහගත කිරීම සඳහා ඊස්රායල ආන්ඩුව යොදා ගත්තේ ද එම තර්කය ම ය. "හිස්බුල්ලාවරුන්ගේ යටිතල පහසුකම්" විනාශ කිරීමේ පදනම මත මිලිටරිය සිවිල් වැසියන් සිය ගනනක් මරා දමමින් ගම්, නගර හා අර්ධ නාගරික ප්‍රදේශ ද බිමට සමතලා කරන ලදි. ක්වානා නගරයට බෝම්බ හෙලීමෙන් පසුව ළමුන් ද ඇතුලු 28 දෙනෙකු මිය ගිය අතර, ඊස්රායල අධිකාරීන් දිගින් දිගට ම කියා සිටියේ එම ගොඩනැගිල්ල රොකට්ටු විදීම සඳහා හිස්බුල්ලාවරුන් විසින් යොදා ගත්තක් බව යි. ඔවුන් එසේ කලේ පුවත්පත් කලාවේදීන් හා ආධාර සපයන සේවකයන් විසින් සපයන ලද සියලු සාක්ෂ්‍ය ඊට ප්‍රතිපක්ෂ වූ බව නො තකා හරිමිනි.

ශ්‍රී ලාංකික මිලිටරිය සතුව ඊස්රායල යුද යන්ත්‍රය තරමට ශක්තිමත් වෙඩි බලයක් නො තිබිය හැකි ය. එහෙත් විධික්‍රම එක හා සමාන යඃ එනම්, සමස්ත ජනගහනයට ම දැනවීමට හා ඔවුන් ත්‍රස්ත කිරීමට එල්ටීටීඊ ඉලක්ක යැයි කියනු ලබන ස්ථානවලට වගවිභාගයක් නැතිව කාල තුවක්කු ප්‍රහාර හා ගුවන් ප්‍රහාර එල්ල කිරීම යි. මාවිල්ආරු ප්‍රදේශය කරා වන හමුදා සැපයුම් මාර්ග කපා හැරීමට තර්ජනය කරමින් අගෝස්තු මස මුල දී එල්ටීටීඊය මුත්තූර් නගරයට පිවිසීමෙන් පසුව විනාශකාරී නොනවතින රොකට් ප්‍රහාරවලින් ද කාල තුවක්කු ප්‍රහාරවලින් ද මිලිටරිය ප්‍රතිචාර දැක්වී ය. සිවිල් වැසියන් ඝාතනය කරමින් සිදු කෙරුනු එම ප්‍රහාරයෙන් 30,000ත් 40,000ත් අතර වූ පදිංචිකරුවන් සංඛ්‍යාවකට නිවාස හැර පලා යාමට බල කෙරුනි.

යුනිසෙෆ් සංවිධානය ඉදිරිපත් කල සාක්ෂ්‍ය කෙරෙහි රඹුක්වැල්ල දැක්වූ ප්‍රතිචාරය වූයේ එල්ටීටීඊය ළමා සොල්දාදුවන් බඳවා ගන්නේ යැයි චෝදනා කරමින් යුනිසෙෆ් සංවිධානය කලින් ඉදිරිපත් කල වාර්තාවක් ගෙන හැර පෑම යි. "යුනිසෙෆ් සංවිධානයට පුලුවන් අපට කියන්න ඔවුන් (ගොදුරු වූවන්) ළමුන් නිසා ඔවුන්ට ප්‍රහාර එල්ල කරන්න එපා කියලා," යි කියූ ඔහු ඊට හාස්‍යජනක එකතු කිරීමක් කරමින් පැවසුවේ ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවට හෝ යුනිසෙෆ් සංවිධානයට යම් සැකයක් ඇත් නම් ආන්ඩුව ඔවුන් එම ප්‍රදේශයට කැඳවා ගෙන යනු ඇති බව යි. ඔහු මෙසේ පවසන්නේ, කිසිවෙකු එල්ටීටීඊ පාලන ප්‍රදේශයට කැඳවා ගෙන යා නොහැකි තත්ත්වයක ආන්ඩුව මේ දැන් සිටියදී ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවත් යුනිසෙෆ් සංවිධානයත් දැනට මත් එම ස්ථානයට ගොස් තම තීන්දුව භාර දී හමාර ය යන කරුන මුලුමනින්ම නොතකාය.

දාමරිකකම මගින් හෙලිදරව් වී ඇත්තේ ආන්ඩුවේ සාපරාධී ස්වභාවය පමනක් නො වේ. එය ගෙන යන යුද්ධය සඳහා කොලඹ මාධ්‍ය පුදන නිහීන සහාය ද ඉන් හෙලි වී තිබේ. අවිවේචනාත්මකව ආන්ඩුවේ මුසා බස් ප්‍රකාශයට පත් කරමින් හා චාරිත්‍රානුකූලව එල්ටීටීඊය "කොටි ත්‍රස්තවාදීන්" යැයි හෙලා දකිමින් දක්ෂිනාංශික පුවත්පත් ආන්ඩුවේ හා මිලිටරියේ තෝල්කයන් සේ එලිපිට ක්‍රියා කරති. දි අයිලන්ඩ් පුවත්පත ඊයේ මෙසේ ප්‍රකාශ කලේ යඃ "ආන්ඩුව මුලතිව්හි බෝම්බ දැමීමක්

පිලිබඳව ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව කරන ප්‍රකාශය ඉවත ලයි." ලක්බිම පුවත්පත සිද්ධිය වාර්තා කලේ "ලමා සොල්දාදුවන්ගේ කඳවුරු පුහුනුවකට එල්ල වූ ගුවන් ප්‍රහාරයක්" ලෙසිනි.

ලිබරල් විකල්පයක වෙස් පෑමට ප්‍රයත්න දරන ඩේලි මිරර් පුවත්පත ඝාතනයට ලක් වූයේ "ලමා සොල්දාදුවන්" ය යන ඔප්පු කල නොහෙන අනුමානය වාර්තා කරමින් "මුලතිව්හි දී තරුනයන් 60කට වැඩි ගනනක් මරනයට පත් වීම වටා අභිරහසක්" යන මැයෙන් යුතු ලිපියක් අඟහරුවාදා පල කලේ ය. යුනිසෙෆ් සංවිධානයේ ප්‍රකාශය නිකුත් වීමෙන් පසුව ද නිවැරදි ආස්ථානයක් ගැනීමට පුවත්පත අසමත් විය. "යුනිසෙෆ් සංවිධානය හා ආන්ඩුව අතර වෙඩි හුවමාරුවේ දී ලමෝ ඝාතනයට ලක් වෙති" යි කියැවුනු ලිපියක් එය ඊයේ පල කලේ ය. එකදු මාධ්‍යයක් වත් ජන සංහාරය පිලිබඳව ස්වාධීන තක්සේරුවක් කිරීමට ප්‍රයත්න දරා නැත.

එල්ටීටීඊය හා යුනිසෙෆ් වැනි සංවිධානයන්හි අදහස් දක්වමින් කරන සීමිත වාර්තාකරනයෙන් පවා වාරන නියෝග පනවන බවට තර්ජන නිකුත් කිරීමට ආන්ඩුව උසි ගැන්වී ඇත. "සියලු මාධ්‍ය ආයතන සඳහා මාර්ගෝපදේශ මාලාවක් හඳුන්වා දීමට" පවතින සැලසුම පිලිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරනු පිනිස ජනාධිපති මහින්ද රාජපක්ෂ පෞද්ගලික හා රාජ්‍ය මාධ්‍ය ප්‍රධානීන් හමු වී ඇති බව ඩේලි මිරර් පුවත්පත වාර්තා කලේ ය. මෙම යෝජනාව ඉදිරිපත් වූයේ පසු ගිය මාසයේ පැවති ආරක්ෂක රැස්වීමක දී ය. පුවත්පත් විසින් කෙරෙන ආවරනය කිරීම්වල දී "එල්ටීටීඊය පිලිබඳ වැරදි ප්‍රවෘත්ති පල කිරීම" සම්බන්ධයෙන් එහි දී ජ්‍යෙෂ්ඨ හමුදා අන දෙන නිලධාරීහු රාජපක්ෂට පැමිනිලි කලහ.

කොලඹ දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය තුල සිටින කිසිවෙකු මුලතිව්හි බෝම්බ හෙලීමට එහි නියම නමින් ආමන්ත්‍රනය කොට නැතඃ එය වනාහි ආන්ඩුව හා මිලිටරිය තුල සිටින ඊට වගකිව යුත්තන්ට නඩු පවරා දඬුවම් පැමිනවිය යුතු යුද අපරාධයකි.

© www.wsws.org